සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024**
**Second Term Test - Grade 09 - 2024**


## චිත්‍ර කලාව

**කාලය පැය 01 යි**

නම / විභාග අංකය:

### I කොටස

- **සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන, අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට අදාළව දී ඇති වාක්‍ය, හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**



01. මෙම රූපයේ දැක්වෙන නිර්මාණය ................................................................. රථය නමින් හඳුන්වයි.
02. ක්‍රි. ව. 1909 - 1910 අතර කාලයට අයත් මෙවන් සුවිශේෂී රථයක් යාපනය .................................................. කෝවිලෙහි දැකිය හැකිය.
03. මෙම රථයේ ප්‍රධාන අංගය වන්නේ මැද කොටස වන අතර එය ................................................ නමින් හඳුන්වයි.
04. ප්‍රධාන කොටස් තුනකින් යුක්ත වන මෙහි, ඉහළ කොටස හා පහළ කොටස සම්බන්ධ කර ඇති කණු ............................ ලෙස හඳුන්වයි.
05. දැවයෙන් නිර්මාණය කර ඇති මෙම නිර්මාණයන්ට පොදුවේ .............................................. යන නම භාවිතා කරයි.


- **අංක 06 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.**

06. වෙස් මුහුණු නිර්මාණය සඳහා පැරණි ශිල්පීන් විසින් භාවිතා කර ඇති දැව වර්ගයක් නම් කරන්න.
...........................................................................................
07. අනුරාධපුර සහ පොළොන්නරු යුග වලදී අර්ධ කවාකාර සඳකඩපහණෙහි හැඩය මහනුවර යුගයේ දී වෙනස් වූයේ කුමන හැඩයටද?
...........................................................................................
08. අනුරාධපුර යුගයේ, කලාත්මක අතින් උසස්ම මුරගල ඇති ස්ථානය නම් කරන්න.
...........................................................................................
09. බුදු පිළිමයක යොදා ඇති විතර්ක මුද්‍රාවෙන් සංකේතවත් කරන අර්ථය කුමක්ද?
...........................................................................................

10. මහනුවර විෂ්ණු දේවාලයේ පියගැටපෙළ අලංකාර කර ඇති මෝස්තර මොනවාද?


.............................................................................................................


- **අංක 11 සිට 15 තෙක් රූප සටහන් වලට සෘජු සබඳතාවක් ඇති රූපය ඉදිරියේ ඇති රූප වලින් තෝරා ඊට අදාල අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

11.  ...........................  **A**

12.  ...........................  **B**

13.  ...........................  **C**

14.  ...........................  **D**

15.  ...........................  **E**

- **අංක 16 සිට 20 තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. පන්ති කාමරයේ දී, නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් කැටයමක් නිර්මාණය කිරීමට වඩාත් සුදුසු මාධ්‍යය කුමක් ද?
    i. දැව    ii. රිජිෆෝම්    iii. ටෙරාකොටා    iv. ගල්
17. බුද්ධ ප්‍රතිමාවක දෙපා පිහිටුවා ඇති ආකාරය හඳුන්වන නම කුමක්ද?
    i. ආසන ක්‍රමය    ii. ආසනය    iii. මුද්‍රාව    iv. හිඳි පිළිමය
18. වෙස් මුහුණු නිර්මාණය කිරීමේ දී, ලී කඳන් කපා පොතු ගසා, කැබලිවලට කපා ගැනීම හඳුන්වන නම කුමක්ද?
    i. ලකුණු කැපීම    ii. පායම් පෑහීම    iii. ගස් කැපීම    iv. ගණ කැපීම
19. යාපනේ නල්ලූර් කන්දස්වාමි කෝවිලෙහි දක්නට ඇති, තිරුම්බෙයි මරුදූර් ගෝවින්දසාමි ශිල්පියා නිර්මාණය කළ, දැව රථය කුමක්ද?
    i. සිම්ම වාහනම්    ii. එලි වාහනම්    iii. කුදිරෙයි වාහනම්    iv. මූසික වාහනම්
20. ලාක්ෂා කර්මාන්තය වර්තමානය වනවිටත් ප්‍රචලිතව පවතින ප්‍රදේශය හඳුන්වන නම කුමක්ද?
    i. යාපනය    ii. හංගිඩි වසම    iii. කුරුණෑගල    iv. මාතලේ හපුවිද


- **අංක 21 සිට 25 දක්වා දී ඇති ප්‍රකාශයන් නිවැරදිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති හිස්තැනෙහි යොදන්න.**

21. ශෛලිගත නාට්‍යවල, විවිධ චරිතවලට අදාළ භූමිකාව ඉස්මතු කිරීම සඳහා, රංග භාණ්ඩ අත්‍යවශ්‍ය වේ. (...........)
22. දාගැබක ආරක්ෂාව පිණිස, දාගැබ වටා ඉදිකරන ලද ගෘහය ප්‍රතිමා ගෘහය ලෙස හැඳින්වේ. (...........)
23. අත් සකපෝරුව භාවිතයෙන්, ඉතා විශාල භාණ්ඩ පහසුවෙන් නිර්මාණය කරගත හැකි වේ. (...........)
24. ඉවතලන ද්‍රව්‍ය, නිර්මාණශීලීව හා ක්‍රමවත්ව යොදා ගනිමින් මූර්තියක් ගොඩනැගිය හැකි වේ. (...........)
25. සෙනරත් පරණවිතාන මහතාට අනුව, සඳකඩපහණෙහි හයවන තීරුව වන අඩ නෙලුමෙන්, නිවන සංකේතවත් වේ. (...........)

- **අංක 26 සිට 30 තෙක් අසා ඇති ප්‍රශ්න වලට F, G, H, I, J යන රූප සටහන් භාවිතා කර පිළිතුරු සපයන්න.**


F


G


H


I



J

26. F අක්ෂරයෙන් දක්වා ඇති නිර්මාණය හඳුන්වන නම කුමක්ද? ...........................................................................
27. G අක්ෂරයෙන් දක්වා ඇති නිර්මාණය හමු වූ ස්ථානය නම් කරන්න.? ...........................................................................
28. H අක්ෂරයෙන් දක්වා ඇති නිර්මාණය ඇති ස්ථානය නම් කරන්න.? ...........................................................................
29. I අක්ෂරයෙන් දක්වා ඇති නිර්මාණය හමු වන සාම්ප්‍රදායික කලාව නම් කරන්න.? ...........................................................
30. J අක්ෂරයෙන් දක්වා ඇති රූපයෙන් පිළිඹිබුවන ශිල්ප ක්‍රමය කුමක්ද? ...........................................................................

- **අංක 31 සිට 35 තෙක් දී ඇති වචන වල අර්ථ පැහැදිලි වන සේ වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.**

31. කිරි හිඳවීම - ..........................................................................................................................................
..........................................................................................................................................
32. නියපොතු වැඩ - ..........................................................................................................................................
..........................................................................................................................................
33. පාටිකා - ..........................................................................................................................................
..........................................................................................................................................
34. මුරගල - ..........................................................................................................................................
..........................................................................................................................................
35. ආයක - ..........................................................................................................................................
..........................................................................................................................................

- **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා පිළිතුරු සැපයීම සඳහා පහත සිතුවම භාවිතා කරන්න. පිළිතුර අර්ථවත් වාක්‍යයකින් ඉදිරිපත් කරන්න. (තනි වචනයකින් පිළිතුරු දීම ලකුණු නොලැබීමට හේතු වේ.)**



36. හඳුනාගත් බව - ..........................................................................................................................................
37. යුගය - ..........................................................................................................................................
38. මාධ්‍යය - ..........................................................................................................................................
39. ශිල්ප ක්‍රමය - ..........................................................................................................................................
40. සත්වාවලියෙන් දැක්වෙන අදහස - ..........................................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## චිත්‍ර කලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### III කොටස

- පහත සඳහන් මාතෘකාවලින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

ප්‍රකාශන
1. වැසි දිනයක්
2. ගමේ සති පොළ
3. පාසලේ ක්‍රීඩා උළෙලක අවස්ථාවක්

මෝස්තර චිත්‍ර
1. ළමුන්ට සුදුසු ඇඳ ඇතිරිල්ලක් සඳහා සත්ව රූපයක් ඇසුරෙන් ව්‍යාප්ත මෝස්තරයක්
2. උද්භිද ගණයට අයත් සැරසිලි ඒකකයක් භාවිතයෙන් කුඩ රෙද්දක් සඳහා සුදුසු මෝස්තරයක්
3. කුෂන් කවරයකට සුදුසු මෝස්තරයක්

ග්‍රැෆික් චිත්‍ර
1. "වන සම්පත සුරකිමු" යන මැයෙන් පෝස්ටරයක් ඇඳ වර්ණ කරන්න.
2. ළමා කතන්දර පොතකට පිටකවරයක් නිර්මාණය කරන්න.

(ලකුණු - 40 යි)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024


## චිත්‍ර කලාව . II

කාලය විනාඩි 30 යි

නම / විභාග අංකයඃ

★ ආදර්ශ චිත්‍රය හා ශාලාධිපතිට උපදෙස්

වාර පරීක්ෂණ කාල සටහනේ සෞන්දර්ය ප්‍රායෝගික පරීක්ෂණ සඳහා වෙන් කර ඇති කාලය මේ සඳහා යොදා ගන්න.



සපයා ගත යුතු ද්‍රව්‍ය :-

01. සුදු පැහැති කඩදාසියකින් ආවරණය කරන ලද හිස් මාරි බිස්කට් පෙට්ටියක්
02. වතුර බොන ලොකු ප්‍රමාණයේ වීදුරුවක්
03. ප්ලාස්ටික් බෝලයක්
04. ද්‍රව්‍ය තැබීමට ආධාරක පුවරුවක්

01. තලය මත රූප සංරචනය කිරීමේ හැකියාව (ල. 05)
02. ද්‍රව්‍යයන්ගේ පරිමාව හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව (ල. 05)
03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය
    පරිමාණ ලක්ෂණ, පර්යාලෝකනය, ත්‍රිමාණ ලක්‍ෂණ, ඇස් මට්ටම හා අවකාශ භාවිතය. (ල. 05)
04. පැන්සලෙන් රේඛා භාවිතා කිරීමේ හැකියාව හා සමස්ත නිමාව (ල. 05)

(සම්පූර්ණ ලකුණු 20 යි)

සිසුවාට ලබාදිය යුතු උපදෙස් :-

ඔබේ විභාග අංකය හා ශ්‍රේණිය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව සඳහන් කරන්න
පැන්සලෙන් පමණක් රේඛා අධ්‍යයනය කරන්න. වර්ණ කිරීම අවශ්‍ය නැත.

රේඛා අධ්‍යයනයේදී

01. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම
02. පරිමාණ ලක්ෂණ, පර්යාලෝකන රීති හා ත්‍රිමාණ ලක්‍ෂණ පැන්සලෙන් මතු කළ යුතුය
03. දෙන ලද ද්‍රව්‍යයන්වල මතුපිට ස්වභාවය හා ගති ලක්‍ෂණ දැක්වීම හා සමස්ත නිමාව